ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
டிஜிட்டல் பொருளாதார அமைச்சு
MINISTRY OF DIGITAL ECONOMY

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
ஆட்களைப் பதிவு செய்யும் திணைக்களம்
DEPARTMENT FOR REGISTRATION OF PERSONS

10 වන මහල, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.
10 ஆம் மாடி,சுஹுருபாய, ஸ்ரீ சுபூத்திபுர வீதி, பத்தரமுல்லை.
10th Floor, Suhurupaya, Sri Subhuthipura rd, Battaramulla.

මගේ අංකය / எனது இல. / My Ref. DRP/OP/10/15/01

ඔබේ අංකය / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2025.08.21

"විශ්වසනීය පුද්ගල අනන්‍යතාව හැඳුනුම්පතයි" "அடையாள அட்டை - நம்பகத்தன்மையான தனிநபர் அடையாளம்" "Identity Card, the Trusted Personal Identity"

දෙපාර්තමේන්තුවේ සියළුම කාර්යය මණ්ඩලය වෙත,

**<u>භික්ෂුණීන් වහන්සේලා සඳහා ජාතික හැඳුනුම්පතට "භික්ෂුණී" නාමය ලබාදීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් 2025.06.16 දිනැතිව ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SCFR/218/2013 දරන නඩු තීන්දුව හා බැඳේ.

02. ඒ අනුව, ජාතික හැඳුනුම්පත් ලබා ගැනීමට ඉල්ලුම්පත් යොමු කරනු ලබන සියම් මහා නිකායේ රංගිරි දඹුලු විහාර පාර්ශවය යටතේ පැවිදි සාමණේරි / උපසම්පදා ලත් සියළුම භික්ෂුණීන් වහන්සේලා සඳහා මහා විහාර වංශික ශ්‍යාමෝපාලී මහ නිකායේ රංගිරි දඹුලු විහාර පාර්ශවයේ මහනායක ස්වාමීන් වහන්සේ විසින් නිකුත් කරන ලද රංගිරි දඹුලු රජ මහා විහාර සංඝ සභාවේ ලියාපදිංචි කරන ලද ප්‍රකාශ පත්‍රය පදනම් කරගෙන ජාතික හැඳුනුම්පතට **<u>"භික්ෂුණී"</u>** නාමය ලබාදීමට කටයුතු කළ යුතුය. (ආදර්ශ පිටපත් අමුණා ඇත.)

03. තවද, සියම් මහා නිකායේ රංගිරි දඹුලු විහාර පාර්ශවය නොවන වෙනත් පාර්ශවයකින් ලබාගත් පැවිදි සහතිකයක් මගින් ජාතික හැඳුනුම්පතට භික්ෂුණී නාමය ඉල්ලා ඉල්ලුම්පතක් යොමුකර ඇති අවස්ථාවකදී ඒ සම්බන්ධයෙන් වැඩිදුර උපදෙස් සඳහා සහකාර කොමසාරිස්/නියෝජ්‍ය කොමසාරිස්/කොමසාරිස් (මෙහෙයුම්) වෙත යොමු කළ යුතුය.

**එම්.එස්.පී සූරියප්පෙරුම**
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් (වැ.බ )

පිටපත්

| | |
|---|---|
| 01. ලේකම්, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය | - කරු.දැ.ගැ.ස |
| 02.සියලුම දිස්ත්‍රික් ලේකම්වරු | - කරු.දැ.ගැ.ස |
| 03.විගණකාධිපති | - කරු.දැ.ගැ.ස |
| 04.සියලුම ප්‍රාදේශීය ලේකම්වරු | - කරු.දැ.ගැ.ස සහ සියලුම ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීම සඳහා |